

**සභාපති හෙන්රි බී. අයිරින්ග් විසින්**
පළමු සභාපතිත්වයේ පළමු අනුශාසක

# සැබෑ ගෝලයින් වීම.

සෑම සක්‍රමේන්තු රැස්වීමකදීම අපට වරප්‍රසාදයක් තිබේ. එම වරප්‍රසාදය නම් අපට දෙව් පියාණන්වහන්සේට යමක් පොරොන්දුවීමේ වරප්‍රසාදයයි. දෙව් පියාණන්වහන්සේට මොන මොන දේවල් පොරොන්දුවීමේ වරප්‍රසාදයද සෑම ක්‍රමේන්තුවකදීම අපට තියෙන්නේ? ගැලවුම්කරුවාණන්වහන්සේව සැමවිටම සිහිකරන්නෙමු කියන පොරොන්දුව එකක්. අනික අප සැම විටම ගැලවුම්කරුවාණන්වහන්සේගේ පණත් පිළිපදින්නෙමු කියන පොරොන්දුවයි. අප මේ පොරොන්දු දෙක ඉටුකළොත් ගැලවුම්කරුවාණන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ අප සමඟ සිටීමට අප උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේව ලබාගන්නෙමු. (බලන්න මොරෝනි 4:3; 5:2; දහම සහ ගිවිසුම 20:77, 79). අප උන්වහන්සේගේ නම අප වෙත ගන්නවිට උන්වහන්සේව සැම විටම සිහිකිරීම අපගෙන් නිතැතින්ම සිදු වේ. අපි මෙය බොහෝ ආකාරයෙන් කරමු. විශේෂයෙන් උන්වහන්සේගේ නාමයෙන් අප අනික් අයට සේවය කරන විට, ඒ වාගේම උන්වහන්සේගේ ශුද්ධවූ වචනය කියවන විට, ඒ වාගේම අප මොනවා කරනවාටද උන්වහන්සේ කැමති කියන එක දැනගන්න අප යාච්ඤා කරන විට අප මෙය, එනම් උන්වහන්සේව සිහිකිරීම කරමු.

මා එක් තරුණයකු බව්තීස්මය කළ විට මට එය සිදුවිය. ගැලවුම්කරුවාණන්වහන්සේගේ පූජකවරය දෙනුලැබූ සේවයකයින් විසින් උන්වහන්සේගේ ශුභාරංචිය උගන්වන්ටත් උන්වහන්සේ ගැන හා උන්වහන්සේගේ සත්‍ය සභාව ගැන සාක්ෂි දරන්ටත් මා ධර්මදූතයකු වශයෙන් කැඳවනු ලද බව මම දැන සිටියෙමි. මගේ ධර්මදූත සගයා සහ මා එම තරුණයා ගැලවුම්කරුවාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් යුක්තව පසුතැවිලිවී උන්වහන්සේගේ බලයලත් සේවකයකුවිසින් බව්තීස්මය කරනුලැබූ විට ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීමේ බලයෙන් පවිත්‍රවන බව ඔහුට පොරොන්දු වී සිටියා.

මා බව්තීස්ම තටාකයේ ජලයේ සිට එම තරුණයාව ඔසවද්දී ඔහු මගේ කනට "මම පවිත්‍රයි, මම පවිත්‍රයි" කියා කෙඳුරුවේය. ඒ මොහොතේදී මට ස්නාවක යොහාන් විසින් ගැලවුම්කරුවාණන්ට ජෝර්දාන් ගඟේ දානය කරන ලද බව්තීස්මය සිහිවිය. ඒ විතරක් නෙමේ යොහාන් කළා වාගේ ශුද්ධාත්මයාණන්වහන්සේ ප්‍රසන්නයෙන් යුක්තව මා උත්ථානවූ සහ ජීවමාන ගැලවුම්කරුවාණන්වහන්සේගේ ගැලවීමේ කාර්යය කරමින් සිටි බව මට සිහිවිය.

මට සහ අප එක්එක්කෙනාට ගැලවුම්කරුවාණන්වහන්සේව සිහිකිරීම උන්වහන්සේ ගැන අපගේ දැනීම හා උන්වහන්සේ සමඟවූ අත්දැකීම් කෙරෙහි රඳාපැවතීමට වඩා දෙයක් විය හැකිය. අපට සැම දාම අපව වර්තමානයේදී උන්වහන්සේ වෙතට වඩා ලංකරන තෝරාගැනීම් කළ හැකිය.

සරලම තෝරාගැනීම ශුද්ධ ලියවිලි කියවීම වෙන්න පුලුවන්. එසේ කිරීමෙන් අපට අප උන්වහන්සේට ලංව සිටින හැඟීම් ලබාගන්න පුලුවන්. මට ලඟභාවය බොහෝවිට දැනෙන්නේ මා මෝර්මන්ගේ පොත කියවන විටය. මා 2 නෙපි හි පරිච්ඡේද කියවන පළමු විනාඩිවලදී නෙපි සහ ලෙහි තමන් ගැලවුම්කරුවාණන්වහන්සේව පෞද්ගලිකව දැනසිටියා මෙන් ගැලවුම්කරුවාණන්වහන්සේව විස්තර කරන ඒ දෙදෙනාගේ හඬවල් මට මගේ මනසේ ඇහෙයි.

ඔබට ශුද්ධවූ ලියවිල්ලේ වෙනත් තැන් ඔබව උන්වහන්සේට විශේෂයෙන් ලං කරන්නට පුලුවන්. කෙසේවෙතත් ඔබ දේව වචනය කොතන සිට කොයි වෙලාවේ බැහැපත්වද ගැලවුම්කරුවාණන්වහන්සේ සිහිකිරීමේ සැබෑ අරමුණින් කියෙව්වත් ඔබට ඔබගේ දිනපතා ජීවිතයෙදි ඔබ මත උන්වහන්සේගේ නම ගන්න ඔබට තියෙන ආශාව වැඩි වෙයි.

එම ආශාව ඔබ ස්වාමින්වහන්සේගේ සභාවෙහි සේවය කරන ආකාරය වෙනස් කරයි. ඔබ ඔබට තුච්ඡ කැඳවීමක් ලෙස පෙනෙන කැඳවීම පවා මහඟු කිරීමට උදව් ඉල්ලා ඔබ පියාණන්වහන්සේට යාච්ඤා කරනු ඇති. ඔබ ඉල්ලන උදව්ව මොනවාද කිව්වොත් එය මෙයයි: ඔබ ඔබව අමතක කර, ඔබ කුමන අයට සේවය කරන්න කැඳවනු ලැබ සිටිනවාද, ඒ අය වෙනුවෙන් ඔබ කළයුතුයයි ගැලවුම්කරුවාණන්වහන්සේ ඔබෙන් බලාපොරොත්තු වන දෙය කෙරෙහි වැඩි අවධානය යොමුකිරීමේ හැකියාවයි.

මා අපගේ දරුවන් සමඟ වූ මගේ සේවයෙහි ශුභාරංචිය පමණක් ගෙන දෙන සාමය ලබාගැනීමට ඔවුන්ට මා උපකාර කරන්නේ කෙසේද කියා දැනගන්න මා යාච්ඤා කළ විට මට උන්වහන්සේගේ හස්තය හා උන්වහන්සේගේ සමීප බව  මට දැනී තියෙනවා. එවැනි වෙලාවල්වල මා සාර්ථක පියෙක් වශයෙන් අනික් අයට පෙනෙනු ලැබෙනවාද යන්න ගැන මා අඩුවෙන් සැලකිලිමත් වුනා. එහෙත් මම මගේ සාර්ථකත්වය හා ඔවුන්ගේ ශුභ සිද්ධි ගැන ගැඹුරෙන් සැලකිලිවත් උනා.

අප සේවය කරන අයට ගැලවුම්කරුවාණන්වහන්සේ දෙනු ඇත්තාවූ දෙය දෙන්නට අප තුල තියෙන ආශාව ස්වර්ගික පියාණන් වහන්සේ වෙත ඇත්තෙන්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සෙගේ නාමයෙන් කරන්නාවා බැහැපත් ඉල්ලීමක් වන යාච්ඤාවල්වලට අපව පොලොඹවයි. අප ඒ ආකාරයට  - ගැලවුම්කරුවාණන්ගේ නාමයෙන්, උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් යාච්ඤා කරනවිට පියාණන්වහන්සේ පිළිතුරු දෙන සේක. උන්වහන්සේ අපට මග පෙනවන්න, අපව සනසන්න, සහ අපව දිරිගන්වන්න ශුද්ධාත්මයාණන්වහන්සේව අප වෙත එවනසේක. ආත්මයාණන්වහන්සේ සැමවිටම ගැලවුම්කරුවාණන්වහන්සේ  ගැන සාක්ෂි දරන නිසා (බලන්න 3 නෙපි 11:32, 36ඥ 28:11; ඊතර් 12: 41), ස්වාමින්වහන්සේට අපගේ මුලු හදවතින්, මනසින්, සහ ශක්තියෙන් ප්‍රේමකරන්න අපගේ ශක්තිය වැඩි වෙයි. (බලන්න මාර්ක් 12:30; ලූක් 10:27; දහම හා ගිවිසුම 59:5).

අප උන්වහන්සේට සේවය කරන විට, උන්වහන්සේගේ වචනය රස විඳින විට  සහ උන්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ලෙන් යාක්ච්ඤා කරනවිට දිනපතා  හා වර්තමාන සිහිකිරීමේ ආශීර්වාදයන් සෙමින් හා ස්ථිරත්වයකින් යුක්තව එනු ඇත. මෙම සිහිකිරීම මේ පොළොව මත ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රාජ්‍යයෙහි ද - පසුව පැමිණෙන්නට තියෙන මහිමාන්විත ලෝකයෙහි උන්වහන්සේගේ පියාණන්වහන්සේ සමඟ උන්වහන්සේගේ සැබෑ ගෝලයන් බවට අපව හැඩගස්වයි.

---

**මෙම පණිවුඩයෙන් ඉගැන්වීම**

සභාපති හෙන්රි අපහට අවවාද කරන්නේ ගැලවුම්කරුවාණන් වෙතට සමීප කරවන දෛනික තීරණ ගැනීමෙන් උන්වහන්සේව සිහිකරන්නටයි. ඔබ උගන්වන පිරිසත් සමඟ, උන්වහන්සේව සැමවිටම මතක තබාගන්නා බවට ඇති ගිවිසුම විස්තර කෙරෙන සැක්‍රමේන්තු යාඥාවන් කියවන්නට පුළුවනි. ගැලවුම්කරුවාණන් සිහිකරන්නට දිනපතාම, තමන් උගන්වන පිරිසට කළහැකි දේවල් ලැයිස්තු කරන්නට ආරාධනා කිරීම සලකා බලන්න. එකිනෙකාගේ සාර්ථකත්වය හා යහපැවැත්ම වෙනුවෙන් දෙවිපියාණන් වහන්සේට යාඥා කරන්නට ඔවුන්ට ආරාධනා කළ හැකියි.

## තාරුණ්‍යය

### දිනපතාම ස්වාමින් මතක් කරගැනීම.

මිතුරන්, වැඩපල, ගෙදරවැඩ, රූපවාහිනිය - අපගේ අවධානය ඉල්ලන බොහෝ දෑ ඇත. නමුත් සෑම සතියකදීම, අපි දෙවිපියාණන් වහන්සේට යාඥා කරන්නේ, “(අපි) සැමවිටකම ( උන්වහන්සේගේ පුත්, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ) සිහිකරන්නා“  බවයි.

අයිරින්ග් සභාපති තුමා කියා සිටින්නේ අපි, “ දිනපතාම ගන්නා තීරණ“ වලින් ගැලවුම්කරුවාණන් සිහිකරගත හැකි බවයි. දිනපතාම ගැලවුම්කරුවාණන් වැඩිවැඩියෙන් සිහිකර සිටින්නට අරමුණක් තබාගන්න. උන්වහන්සේ සමඟ වූ ඔබගේ සබඳතාවය ගොඩනගන්නට දිනපතාම එක් කටයුත්තක් කැලැන්ඩරයක ලියාගෙන, ඉටුකරන්න. ශුද්ධ ලියවිලි පරිහරණය, ඇදහිල්ලෙන් යාඥා කිරීම, ගැලවුම්කරුවාණන්, අන් අයත් අරඹයා සේවය කිරීම. තවද දිනපොතේ සටහන් කිරීම, සභා රැස්වීම් වලට පැමිණීම, පොදු සම්මන්ත්‍රණයට සවන්දීම, දේවමාළිගාවට යාම, යාතිකා ගැයීම සිදුකළ හැක.- ලැයිස්තුවේ නිමක් නැත.! දිනපතාම ගැලවුම්කරුවාණන් සිහිකිරීමෙන්, “ ආශිර්වාද .. ක්‍රමක්‍රමයෙන් පැමිණ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සැබෑ ගෝලයින් බවට අපිව පත්කරනු බව සභාපති අයිරින්ග් සහතික කළේය.

## දූ දරුවන්

### විශාල ප්‍රේමයක් / මහඟු ප්‍රේමයක්

අපි ශුද්ධ ලියවිලි කියවන විට හෝ යාඥා කරන විට, දෙවිපියාණන් වහන්සේ හා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපහට කෙතරම් ප්‍රේම කරනවාදැයි අපිට දැනේ. විශාල හදවතක් තුළ කුඩා හදවත් රූප සටහනක අඳින්න. ඔබ යාඥා කරන විට හා ශුද්ධ ලියවිපි කියවන සෑම විටෙකදීම එක් හදවතක් පාට කරන්න. දෙවිපියාණන් වහන්සේට හා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට සමීප බව දැනෙන්නට තවත් කළ හැකි දෑ ඇත් ද?

© 2017 by All rights reserved. Printed in USA. English approval: 6/16. Translation approval: 6/16. Translation of 97930 408

# නොමඟ ගියාවූ ඔවුන්ට දයාව දිගු හැරීම

බෙදා ගත යුත්තේ කුමක් දැයි දැන ගැනීම පිණිස යාඥාවෙන් මෙම කරුණු අධ්‍යනය කර දිව්‍යඥානය සොයන්න. සහන සමිතියේ අරමුණ තේරුම් ගැනීමෙන් සදාකාලික ජීවනයේ ආශිර්වාද සඳහා දෙවියන් වහන්සේගේ දියණියන් සූදානම් කරනුයේ කෙසේද?

ඇදහිල්ලේ පවුල් සහනය

“යථාර්ථය නම් අංගසම්පූර්ණ පවුල් නැත ....,” පළමු සභාපතිත්වයේ දෙවෙනි උපදේශක ඩියෙටර් එෆ්. උච්ට්ඩොර්ෆ් කිව්වා. “ඔබගේ පවුල කුමන ප්‍රශ්නවලට මුහුන දෙමින් සිටියත්, ඒවා විසඳන්න ඔබ කළ යුතු දේ කුමක් වුවත්, විසඳුමේ මුල සහ අග ප්‍රේමයයි, ක්‍රිස්තුස්වහන්සේගේ පවිත්‍රප්‍රේමයයි” [1]

සහන සමිතියේ හිටපු ප්‍රධාන සභාපති ලින්ඩා කේ.බර්ටන් ශුභාරංචියෙහි මුලුමනින්ම සහභාගි නොවන අය ගැන මෙසේ කීවාය: “ ස්වර්ගික පියාණන්වහන්සේ තමන්වහන්සේගේ සියලුම දරුවන්ට - ඔවුන් මාර්ගයේ හෝ මාර්ගයෙන් පිට හිටියත් - ඔවුන් කොහෙ හිටියත් - ආදරය කරන සේක - ඔවුන් සියලුදෙනාම ගෙදරට එන එක උන්වහන්සේට උවමනායි.” [2].

“(ඔබගේ දරුවන්) කෙතරම් අයාලේ සිටියත් ...ඔබ ඔවුන්ට කථාකරන විට හෝ අමතන විට, එය තරහවෙන් කරන්න එපා, රළුවට එය කරන්න එපා, හෙලාදැකීමේ ආත්මයකින් එය කරන්න එපා”, සභාපති ජෝසප් එෆ්. ස්මිත් (1838 – 1918). “ඔවුන්ට කරුණාවෙන් කථාකරන්න.” [3].

හැත්තෑවරුන්ගෙන් කෙනෙක් වන වැඩිහිටි බ්‍රෙන්ට් එච්. නීල්සන් රිදීකාසි 10ක් තිබී එකක් නැතිවූවන්ළු ගැලවුම්කරුවාණන්වහන්සේගේ උපදෙස නැවත කිව්වා: “ඔබ එය ලැබෙන තෙක් එය සොයන්න. නැති වූ එක්කෙනා ඔබගේ පුතා හෝ දුව, ඔබගේ සහෝදරයා හෝ සහෝදරිය . . .වන විට අපට කළ හැකි සෑම දේටම පස්සේ අපි එම තැනත්තාට අපගේ මුලු හදවතින් ආදරය කරමු.....

“අපගේ ජීවිතවල්වලදී නැති වූ අය වෙත අප ලංවිය යුතු හොඳම ආකාරය දැනගන්න ඔබටත් මටත් එලිදරව්ව ලැබේවා. තවද අප අකීකරු තැනැත්තාට ආදරය කර, ඒ තැනැත්තාව බලමින් එනතෙක් ඉවසීමෙන් පුලපුලා සිටිනවිට බ අවශ්‍ය වූ විට ස්වර්ගයේ අපගේ පියාණන්වහන්සේගේ සහ උන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉවසීමත් ආදරයත් අපට තිබේවා.” [4]

පළමු සභාපතිත්වයේ පළමු උපදේශක සභාපති හෙන්රි බී. අයිරිං මෙසේ කීවේය: “මා ආදරය කරන කෙනෙක් වන්දිගෙවීමේ බලය සොයත්වා හා එය ඔහුට /ඇයට දැනේවා කියා මා ඇදහිල්ලෙන් යාච්ඤා කර ඇත්තෙමි. මිනිස් දේවදූතයින් ඔවුන්ගේ උදව්වට එත්වා කියා මම ඇදහිල්ලෙන් යුක්තව යාච්ඤා කර තියෙනවා, මිනිස් දේවදූතයෝ පැමිණියහ.

"උන්වහන්සේගේ දරුවන් එකිනෙකා ගලවා ගන්නා ක්‍රම දෙවියන් වහන්සේ සැලසුම් කර ඇත." [5]

## *අතිරේක ශුභාරංචි සහ තොරතුරු*

Matthew 18:12; Alma 31:35; 3Nephi 13:32; D&C 121:41-42

### සටහන්


1. Dieter F. Uchtdorf, “In Praise of Those Who Save,” *Liahona,* May 2016, 79, 80.
2. Linda K. Burton, in Sarah Jane Weaver, “Sister Burton, Sister Wixom Visit Church’s Pacific Area,” Church News, Apr. 2, 2013, .
3. *Teachings of Presidents of the Church: Joseph F. Smith* (1998), 254.
4. Brent H. Nielson, “Waiting for the Prodigal,” *Liahona,* May 2015, 103.
5. Henry B. Eyring, “To My Grandchildren,” *Liahona,* Nov. 2013, 71.


***පහත සඳහන් දෙය සලකාබලන්න:***

ශුභාරංචියේ මූලධර්ම අනුව ජීවත්වෙන්න උවමනාවක් නැති අය වෙත අප ප්‍රේමය නොකඩවා දක්වන්න පුලුවන් කොහොමද?

© 2017 by All rights reserved. Printed in USA. English approval: 6/16. Translation approval: 6/16. Translation of 97930 408